ST. SEBASTIAN'S COLLEGE – MORATUWA
සාන්ත සෙබස්තියන් විදුහල - මොරටුව

| 21 | S | I |
|---|---|---|

13 වන ශ්‍රේණිය - අවසාන වාර පරීක්ෂණය
Grade 13 – 3rd Term Test – 2018

# ආර්ථික විද්‍යාව (Economics) - Withdrawal Test

කාලය පැය දෙකයි
Two Hours

නම :- ................................................................ පන්තිය :- ............ පන්ති අංකය :- ............

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු වලින් ඉතාමත් ගැළපෙන හෝ නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති තිත් වරහන තුළ යොදන්න.**

**1.** සාර්ව ආර්ථික සංකල්පමය අදහසක් නිරූපණය කරනු ලබන පිළිතුර වන්නේ,
(i) පෞද්ගලික ව්‍යවසායකයාගේ අරමුණ ලාභය යි.
(ii) මිලේ සංවේදීතාව ප්‍රමාණයේ සංවේදීතාව ට සමාන වූ විට මිල නම්‍යතා සංගුණකය ඒකීය වේ.
(iii) පාරිභෝගික අතිරික්තය මිල යන්ත්‍රණය මගින් පාරිභෝගිකයාට ලබා දෙන ශුභ සාධනයකි.
(iv) ආර්ථික වෘද්ධිය හා ආර්ථික සංවර්ධනය එක ම සංකල්පයක් නොවේ.
(v) සමතුලිත මිල පාරිභෝගිකයාට මෙන් ම නිෂ්පාදකයාට වාසිසහගත වේ.
(...........)

**2.** අභිමතානුරූපී නොවන ප්‍රකාශනය ඉදිරිපත් කෙරෙන පිළිතුර වන්නේ,
(i) වැඩිවන ජීවන වියදමට සාපේක්ෂ ව වැටුප් වැඩි කිරීමට කඩිනම් පියවර ගත යුතු ය.
(ii) පාසල් සිසුන් සඳහා ක්‍රීඩා අනිවාර්ය කළ යුතු ය.
(iii) ශ්‍රී ලංකාවේ දරිද්‍රතා අනුපාතය අවම වෙමින් පවතී.
(iv) මන්දපෝෂණය වැළැක්වීමට පියවර ගත යුතු ය.
(v) ආනයන සීමා කිරීමට පියවර නොගැනීම දේශීය කර්මාන්ත තව තවත් විනාශයට හේතු වේ.
(...........)

**3.** කිසියම් ආර්ථිකයක් නිෂ්පාදන හැකියා මායිම ඇතුළත ලක්ෂ්‍යයක කටයුතු කරන විට වඩාත් උචිත ප්‍රකාශනය වන්නේ එම ආර්ථිකයේ,
(i) නිෂ්පාදන සාධක පූර්ණ සේවා නියුක්ත කර තිබීම යි.
(ii) සම්පත් උපයෝජනය වැඩි කර ගන්නා බව යි.
(iii) ආවස්ථික පිරිවැය ශූන්‍ය වී තිබෙන බව යි.
(iv) සියලු සම්පත් එක් විචල්‍යයක් සඳහා කැප කර ඇති බව යි.
(v) ස්ථාවර ආවස්ථික පිරිවැයකට හිමිකම් කියන බව යි.
(...........)

**4.** පහත ඉදිරිපත් කර ඇති ප්‍රකාශ අතුරින් බාල භාණ්ඩයක් සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(i) මිලත් ඉල්ලුමත් අතර ඇත්තේ අනුලෝම සම්බන්ධතාවයකි.
(ii) මිලත් ඉල්ලුමත් අතර ඇත්තේ ප්‍රතිලෝම සම්බන්ධතාවයකි.
(iii) ආදායමත් ඉල්ලුමත් අතර ඇත්තේ අනුලෝම සම්බන්ධතාවයකි.
(iv) ආදායමත් ඉල්ලුමත් අතර ඇත්තේ ශූන්‍ය සම්බන්ධතාවයකි.
(v) ආදායමත් ඉල්ලුමත් අතර ඇත්තේ ප්‍රතිලෝම සම්බන්ධතාවයකි.
(...........)

Artsapi.lk

**5.** පහත ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ භාවිතා කර ලබාගත හැකි නිවැරදි පිළිතුර වන්නේ,

$Qd = 50 - 2P$

$Qs = -10 + 4P$

| | සමතුලිත මිල | සමතුලිත ප්‍රමාණය | පාරිභෝගික අතිරික්තය |
|---|---|---|---|
| (i) | 10 | 30 | 200 |
| (ii) | 10 | 30 | 225 |
| (iii) | 20 | 70 | 225 |
| (iv) | 20 | 70 | 200 |
| (v) | 10 | 70 | 250 |

(...........)

**6.** X භාණ්ඩයේ මිල වැඩිවන විට සලකා බලන Y භාණ්ඩයේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වේ. N භාණ්ඩයේ මිල වැඩි වන විට සලකා බලන M භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වේ. X හා Y අතර සහ N සහ M අතර සම්බන්ධතාව වන්නේ,

| | X සහ Y අතර | N සහ M අතර |
|---|---|---|
| (i) | සාමාන්‍ය භාණ්ඩ | බාල භාණ්ඩ |
| (ii) | බාල භාණ්ඩ | සාමාන්‍ය භාණ්ඩ |
| (iii) | අනුපූරක භාණ්ඩ | ආදේශක භාණ්ඩ |
| (iv) | ආදේශක භාණ්ඩ | අනුපූරක භාණ්ඩ |
| (v) | සුඛෝපභෝගී භාණ්ඩ | ගිෆන් භාණ්ඩ |

(...........)

**7.** කිසියම් භාණ්ඩයක සැපයුම් වක්‍රය පූර්ණ අනම්‍ය වේ. ඉල්ලුම් වක්‍රය සාමාන්‍ය වේ. $P_1$ සමතුලිත මිල වන්නේ නම් අදාළ භාණ්ඩයේ මිල අඩු කළහොත්,

(i) ඉල්ලුම ශූන්‍ය වේ.

(ii) ඉල්ලුම සහ සැපයුම නොවෙනස්ව පවතී.

(iii) අධි ඉල්ලුමක් හට ගනු ඇත.

(iv) අධි සැපයුමක් හට ගනු ඇත.

(v) වෙළෙඳපොළේ කිසිදු වෙනසක් ඇති නොවේ.

(...........)

**8.** වෙළෙඳපොළ නිරීක්ෂණය කළ කණ්ඩායමක් X භාණ්ඩයේ සංගුණකය 0.5 ලෙසත්, Y භාණ්ඩයේ සංගුණකය 1.2 ලෙසත් හඳුනාගත් පසු භාණ්ඩ දෙකේ ම මිල සියයට 20 කින් වැඩි කිරීමට තීරණය කරන ලදී.

| | X - භාණ්ඩයේ පැහැදම | Y - භාණ්ඩයේ පැහැදම |
|---|---|---|
| (i) | වැඩි වේ | වැඩි වේ |
| (ii) | වෙනස් නොවේ | වෙනස් වේ |
| (iii) | වැඩි වේ | අඩු වේ |
| (iv) | ශූන්‍ය වේ | අඩු වේ |
| (v) | අඩු වේ | අඩු වේ |

(...........)

Artsapi.lk

**9.** $P_2$ සඑල අවම මිලක් ප්‍රකාශයට පත්කර ඌන පූර්ණ නිෂ්පාදන සහනාධාරය ක්‍රියාත්මක කළහොත් වඩා නිවැරදි ලක්ෂණය හඳුනා ගන්න.




(i) පාරිභෝගික අතිරික්තය අඩු වී නිෂ්පාදන අතිරික්තය විශාල වේ.
(ii) නිෂ්පාදන අතිරික්තය අඩු වී පාරිභෝගික අතිරික්තය විශාල වේ.
(iii) පාරිභෝගික සහ නිෂ්පාදන අතිරික්තයන් දෙකම විශාල වේ.
(iv) ආර්ථික අතිරික්තය නොවෙනස්ව පවතින අතර නිෂ්පාදන අතිරික්තය විශාල වේ.
(v) කිසිදු බලපෑමකට යටත් නොවන ලෙස රජය වෙළෙඳපොළ සුරක්ෂිත කරයි.

(...........)

**10.** රජය හඳුනාගත් භාණ්ඩ කිහිපයක් සඳහා ඒකක බදු ප්‍රකාශ කරන ලදී. මෙම භාණ්ඩ අතරින් බද්දේ ප්‍රමාණයෙන් ම භාණ්ඩ මිල ඉහළ යෑම ගැනුම්කරු දරණ අවස්ථා මත ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර නම්‍යතාවයට කරන බලපෑම වන්නේ,

| | ඉල්ලුම් වක්‍රයේ නම්‍යතාව | සැපයුම් වක්‍රයේ නම්‍යතාව |
|---|---|---|
| (i) | පූර්ණ අනම්‍ය | පූර්ණ නම්‍ය |
| (ii) | පූර්ණ නම්‍ය | පූර්ණ අනම්‍ය |
| (iii) | අනම්‍ය | අනම්‍ය |
| (iv) | පූර්ණ අනම්‍ය | ඒකීය නම්‍ය |
| (v) | ඒකීය නම්‍ය | පූර්ණ අනම්‍ය |

(...........)

**11.** ඒකක බද්දක් ප්‍රකාශ කරන විට අදාළ භාණ්ඩයේ ඉල්ලුම් වක්‍ර හෝ සැපයුම් වක්‍ර හෝ පූර්ණ අනම්‍ය තත්ත්වයක පවතී නම්, ශුභ සාධනයට සිදුවන හානිය,

(i) හානිය ඉතා විශාල වේ.
(ii) හානිය ඉතා අල්ප වේ.
(iii) කිසිදු හානියක් සිදු නොවනු ඇත.
(iv) ගැනුම්කරුට පමණක් හානියක් සිදු වේ.
(v) විකුණුම්කරුට පමණක් හානියක් සිදු වේ.

(...........)

**12.** කෙටිකාලයේ දී එක්තරා අවස්ථාවකින් පසු විචල්‍ය යෙදවුමේ කාර්යක්ෂමතාව හීනවීම සිදු වේ. මෙම තත්ත්වය වළක්වා ගැනීමට නම්,

(i) විචල්‍ය යෙදවුම් ක්‍රමයෙන් අඩු කර නිෂ්පාදනයේ යෙදීම.
(ii) විචල්‍ය යෙදවුම් ස්ථාවර මට්ටමක තබාගෙන නිෂ්පාදනයේ යෙදීම.
(iii) ආයතනය සතු ස්ථාවර යෙදවුම් වැඩි කිරීම කළ යුතු වේ.
(iv) ආන්තික පිරිවැය අඩු කර ආන්තික ඵලදාව වැඩි කර ගැනීම.
(v) විචල්‍ය සාධකයේ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම.

(...........)

**13.** ආයතනයක් කර්මාන්තයෙන් ඉවත් වීමට තීරණය කරන්නේ,

(i) ආර්ථික ලාභ ශූන්‍ය අවස්ථාවක දී
(ii) මුළු විචල්‍ය පිරිවැයට වඩා මුළු අයභාරය වැඩිවන අවස්ථාවක දී
(iii) සාමාන්‍ය අයභාරයට වඩා සාමාන්‍ය පිරිවැය වැඩි වූ අවස්ථාවක දී
(iv) මුළු විචල්‍ය පිරිවැය මුළු අයභාරය තුළින් පියවා ගත නොහැකි අවස්ථාවක දී
(v) ආන්තික පිරිවැය ආන්තික අයභාරයට සමාන වන අවස්ථාවක දී.

(...........)

Artsapi.lk

**14.**

| යෙදවුම් | | නිමැවුම් | | |
|---|---|---|---|---|
| ශ්‍රමය | ප්‍රාග්ධනය | මුළු නිෂ්පාදනය (TP) | සාමාන්‍ය නිෂ්පාදිතය (AC) | ආන්තික නිෂ්පාදිතය (MP) |
| 3 | 10 | | 07 | |
| 4 | 10 | | 10 | |
| 5 | 10 | | 11 | |
| 6 | 10 | | 10 | |
| 7 | 10 | | 09 | |

ඉහත ලේඛනයට අනුව ආන්තික නිෂ්පාදනය (MP) උපරිම වන්නේ කවර ශ්‍රම ඒකකයේ දී ද?

(i) ඒකක 3 (ii) ඒකක 5 (iii) ඒකක 4 (iv) ඒකක 6 (v) ඒකක 7

(...........)

**15.** පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක් තුළ දැකිය නොහැකි ලක්ෂණයක් වන්නේ,

(i) කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වේ.
(ii) ආයතනයේ ඉල්ලුම් වක්‍රය ප්‍රමාණ අක්ෂයට සමාන්තරව තීරණය වේ.
(iii) සැපයුම්කරුවා කුඩා සැපයුම්කරුවකු බැවින් මිලට බලපෑම් කළ නොහැකි වේ.
(iv) වෙළෙඳපොළ තොරතුරු පූර්ණ බැවින් නව සැපයුම්කරුවන්ට කර්මාන්තයට ප්‍රවේශ වීමට අපහසු වේ.
(v) එක් ආයතනයක භාණ්ඩ තවත් ආයතනයක භාණ්ඩවලට ආදේශක වේ. මේ නිසා භාණ්ඩ අතර සමාන උපයෝගීතාවයක් අපේක්ෂා කළ හැකි ය.

(...........)

**16.** කතිපයාධිකාරී වෙළෙඳපොළක, වෙළෙඳපොළ ආධිපත්‍ය රඳා පවතින්නේ,

(i) පරිමාණානුකූල පිරිමැසුම් මතයි.
(ii) කීර්තිනාමය මතයි.
(iii) උපායමාර්ග ක්‍රියා මතයි.
(iv) නෛතික සාධක මතයි.
(v) දැඩි අන්‍යෝන්‍යතාව මතයි.

(...........)

**17.** විභව දළ දේශීය නිෂ්පාදිතයට වඩාත් හොඳින් වඩාත් හොඳින් විග්‍රහ වී ඇති ප්‍රකාශය වන්නේ,

(i) උද්ධමන පීඩනයකින් තොරව ආර්ථිකයට නිපදවිය හැකි උපරිම තිරසාර නිමැවුම් මට්ටමයි.
(ii) ආර්ථිකයට නිපදවිය හැකි උපරිම භාණ්ඩ හා සේවා ධාරිතාවේ නාමික වටිනාකමයි.
(iii) ආර්ථිකයේ නිමැවුම මූර්ත වශයෙන් අඛණ්ඩව වර්ධනය වීමයි.
(iv) නාමික දළ දේශීය නිෂ්පාදිතය මිල දර්ශකයක් යොදා අවධමනය කළ විට තීරණය වන අගයයි.
(v) දළ ජාතික නිෂ්පාදිතයට වෙළෙඳ අනුපාතය ගැලපූ විට ලැබෙන අගය යි.

(...........)

**18.** ජාතික ගිණුම්වලට ඇතුළත් කළ නොහැකි මූල්‍ය ප්‍රවාහයක් වන්නේ.

(i) රජයේ සේවක වැටුප් සඳහා රු. බිලියන 2.5 ක් අයවැයෙන් වෙන් කිරීමයි.
(ii) මානව සම්පත් සංවර්ධනය සඳහා රු. බිලියන 0.5 ක් වෙන් කිරීමයි.
(iii) ජාතික ලොතරැයි මණ්ඩලය රු. බිලියන 2 ක් ලොතරැයි දිනුම් සඳහා වෙන් කිරීමයි.
(iv) ආර්ථිකයේ තොග වෙනස්වීම් රු. බිලියන 0.001 ක සෘණ අගයක් පෙන්නුම් කිරීමයි.
(v) ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග සංවර්ධනය සඳහා රු. බිලියන 1.0 ක් වැය කිරීමයි.

(...........)

Artsapi.lk

**19.** පහත ප්‍රකාශන අතරින් ඔබට එකඟ විය නොහැකි ප්‍රකාශය කුමක් ද?
(i) ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ ශේෂය ශුද්ධ විදේශ ආයෝජනය ලෙස පිළිගනු ඇත.
(ii) දළ දේශීය වියදමට ශුද්ධ අපනයන එකතු කළ විට එය දළ දේශීය නිෂ්පාදිතයට සමාන වේ.
(iii) දළ දේශීය වියදමට වර්තන ගිණුමේ ශේෂය ගැලපූ විට වැය කළ හැකි දළ ජාතික නිෂ්පාදිත අගය ලැබේ.
(iv) සේවා නියුක්ති ආදායමට + බදු කුලී, + ශුද්ධ පොලී, + සාංගමික ලාභ, ස්වයං රැකියා ආදායම් ගැලපූ විට එම අගය දළ දේශීය ආදායමට සමාන වේ.
(v) දළ ජාතික නිෂ්පාදිතය - අහිමි වූ කුටුම්භ ආදායම් + කුටුම්භ සංක්‍රාම = කුටුම්භ ආදායම් - සෘජු බදු = වැය කළ හැකි කුටුම්භ ආදායමයි.

(...........)

**20.** ආන්තික පරිභෝජන නැඹියාව 3/4 වන ආර්ථිකයක ආණ්ඩුවේ මිල දී ගැනීම් රු. මිලියන 100 කින් වැඩි වූයේ නම් නිමැවුම උපරිම වශයෙන් වැඩිවන්නේ කොපමණකින් ද?

| | | |
|---|---|---|
| (i) රු. බිලියන 400 | (iii) රු. බිලියන 250 | (v) රු. බිලියන 1,000 |
| (ii) රු. බිලියන 600 | (iv) රු. බිලියන 150 | |

(...........)

**21.** C = 400 + 0.25Yd / I = 100
මෙම ආර්ථිකයේ ආයෝජන අගය රු. මිලියන 50 කින් වැඩි වුවහොත් නිමැවුම කොපමණ ප්‍රමාණයකින් වෙනස් වේ ද?

| | | |
|---|---|---|
| (i) රු. බිලියන 200 | (iii) රු. බිලියන 250 | (v) රු. බිලියන 500 |
| (ii) රු. බිලියන 150 | (iv) රු. බිලියන 400 | |

(...........)

**22.** සරල ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය C = 100 + 0.8Yd වේ. ආයෝජනය රු. 50 ක් වේ. මෙම ආර්ථිකයේ ඉතුරුම් ශූන්‍ය වන ආදායමත්, සමතුලිත ආදායමත් පරිභෝජන හා ඉතුරුම් අගයත් නිවැරදිව දැක්වෙන්නේ,

| | ඉතුරුම් ශූන්‍ය වන ආදායම | සමතුලිත ආදායම | පරිභෝජන අගය | ඉතුරුම් අගය |
|---|---|---|---|---|
| (i) | 800 | 750 | 600 | 50 |
| (ii) | 500 | 750 | 700 | 50 |
| (iii) | 400 | 250 | 600 | 150 |
| (iv) | 200 | 250 | 800 | -50 |
| (v) | 100 | 250 | 600 | 150 |

(...........)

**23.** ආවෘත ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත පෙළක් පහත දැක්වේ.
දළ දේශීය නිෂ්පාදිතය (Y) = 20 / පරිභෝජනය (C) = 4 / ආයෝජනය (I) = 4 / රජයේ සංක්‍රාම (TR) = 1 / සෘජු බදු (T) = 3 භාවිතා කර පහත සඳහන් දෑ ගණනය කරන්න.

| | වැය කළ හැකි පෞද්ගලික ආදායම | පෞද්ගලික ඉතුරුම් | රජයේ ඉතුරුම් |
|---|---|---|---|
| (i) | 19 | 7 | -6 |
| (ii) | 20 | 6 | -2 |
| (iii) | 12 | 4 | -1 |
| (iv) | 15 | 5 | -4 |
| (v) | 10 | 6 | -6 |

(...........)

Artsapi.lk

**24.** සරල ආර්ථිකයක කිසියම් වර්ෂයක් තුළ ආයෝජන වියදම රු. බිලියන 200 කින් වැඩි විය. සමතුලිත ජාතික ආදායම රු. බිලියන 1,000 කින් වැඩි වේ යැයි සිතන්න. මෙම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැමියාව කොපමණ ද?

(i) 0.2 කි (ii) 0.8 කි (iii) 0.6 කි (iv) 0.4 කි (v) 7.5 කි

(..........)

**25.** රටක භාණ්ඩ හා සේවාවල මිල විචලයයන් හඳුනා ගැනීමට යොදාගත හැකි උපකරණය කුමක් ද?

(i) මිල දර්ශකය (ii) කාල ශ්‍රේණිය (iii) වර්තන මිල (iv) සාපේක්ෂ මිල (v) නිරපේක්ෂ මිල ගණන්

(..........)

**26.** එක්තරා ශ්‍රමිකයකුගේ වර්ෂ දෙකක වැටුප් දර්ශක සහ අදාළ වර්ෂයේ මිල දර්ශක පහත දැක්වේ.

| වර්ෂය | මුල්‍ය වැටුප | මිල දර්ශකය |
|---|---|---|
| 1 | 200,000 | 100 |
| 2 | 220,000 | 108 |

දෙවන වර්ෂයේ දී ශ්‍රමිකයාගේ මූර්ත වැටුප ඉහළ යාමේ ප්‍රතිශතය වන්නේ,

(i) 10 (ii) 8 (iii) 2 (iv) 4 (v) 6

(..........)

**27.** 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතිකය වන්නේ කුමක් ද?

(i) 3.1 (ii) 4.5 (iii) 4.0 (iv) 4.8 (v) 4.4

(..........)

**28.** ශ්‍රී ලංකා මහ බැංකුව පොලී අනුපාත කොරිඩෝව ඉහළට සංශෝධනය කරනු ලැබූ විට,

| | ආයෝජන පිරිවැය | සමාහාර ඉල්ලුම |
|---|---|---|
| (i) | බලපෑමක් නැත | අඩු වේ |
| (ii) | වැඩි වේ | වැඩි වේ |
| (iii) | අඩු වේ | අඩු වේ |
| (iv) | වැඩි වේ | අඩු වේ |
| (v) | වැඩි වේ | බලපෑමක් නැත |

(..........)

**29.** එක්තරා ආර්ථිකයක මුදල් තොගය රු. මිලියන 4,800 ද මුදලේ සංසරණ ප්‍රවේගය 5 ක් ද, මූර්ත නිමැවුම ඒකක මිලියන 200 ද වේ. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී මෙම ආර්ථිකයේ මුදල් තොගය 10% කින් වැඩිවුනි නම් නව මිල දර්ශකය,

(i) 125 (ii) 132 (iii) 120 (iv) 140 (v) 130

(..........)

**30.** පහත දැක්වෙන ඒවායින් වටිනාකමේ සන්නිධියක කාර්යය ඉටු කරන එහෙත් විනිමය මාධ්‍යයක කාර්යය කොහෙත්ම ඉටුකළ නොහැකි මූල්‍ය වත්කම කුමක් ද?

(i) ව්‍යවහාර මුදල් (ii) ඉල්ලුම් තැන්පතු (iii) ණයපත් (iv) ස්ථාවර තැන්පතු (v) ඉතුරුම් තැන්පතු

(..........)

Artsapi.lk

**31.** එක්තරා ආර්ථිකයක වාණිජ බැංකු පද්ධතිය 10% ක ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකයක් යටතේ ක්‍රියාත්මක වේ. අධි සංචිත ශූන්‍ය මට්ටමක පැවතිය දී මහජනතාව රුපියල් මිලියන 500 ක් වාණිජ බැංකුවක තැන්පත් කරයි. මෙම සිදුවීම නිසා ආර්ථිකයේ මුදල් සැපයුම කෙසේ වෙනස් වේ ද?

(i) රු. මිලියන 500 කින් අඩු වේ.
(ii) රු. මිලියන 5,000 කින් වැඩි වේ.
(iii) රු. මිලියන 500 කින් වැඩි වේ.
(iv) රු. මිලියන 4,500 කින් වැඩි වේ.
(v) වෙනස් නොවේ.

(...........)

**32.** රටක මුදල් සැපයුම පදනම් මුදල්වලට වඩා වැඩිවීමට හේතුව කුමක් ද?

(i) වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්, මුදල් සැපයුමට ඇතුළත් වීම.
(ii) වාණිජ බැංකු බිහි කරන ලද ඉල්ලුම් තැන්පතු මුදල් සැපයුමට අයත් වීම.
(iii) රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු පදනම් මුදල් සේ සැලකීම.
(iv) නිකුත් කළ සියලුම ව්‍යවහාර මුදල්, මුදල් සැපයුමට ඇතුළත් වීම.
(v) මූල්‍ය පදනමට ඉතිරිකිරීමේ තැන්පතු ද ඇතුළත් වීම.

(...........)

**33.** මහජනතාව සතු පහත සඳහන් වත්කම් අතුරින් ඉහළම ද්‍රවශීල වත්කම කුමක් ද?

(i) ඉතුරුම් තැන්පතු
(ii) භාණ්ඩාගාර බිල්පත්
(iii) විදේශ මුදල්
(iv) ඉල්ලුම් තැන්පතු
(v) සමාගම් කොටස්

(...........)

**34.** මහ බැංකුවේ අරමුණක් වන මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව ඉටුකරගැනීම සඳහා පහත සඳහන් කිනම් කාර්යය යොදාගනු ලැබේ ද?

(i) රාජ්‍ය ණය කළමනාකරණය
(ii) නිල විදේශ සංචිත කළමනාකරණය
(iii) විනිමය අනුපාත ප්‍රතිපත්තිය මෙහෙයවීම.
(iv) මූල්‍ය ආයතන අධීක්ෂණය සහ නියාමනය කිරීම.
(v) මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම.

(...........)

**35.** පාරිභෝජනය කරන්නාගෙන් මිලක් අයකල නොහැකි හා අතිරේක පුද්ගලයකු පාරිභෝජනය කරනු ලබන විට ආන්තික පිරිවැයක් දැරිය යුතු වන භාණ්ඩය වන්නේ,

(i) අර්ධ පොදු භාණ්ඩ
(ii) ශුභ සාධන භාණ්ඩ
(iii) පොදු දේපළ සම්පත්
(iv) පෞද්ගලික භාණ්ඩ
(v) ශුද්ධ පොදු භාණ්ඩ

(...........)

**36.** රජය යම් භාණ්ඩයක් මත බද්දක් පැනවීම නිසා අධි බදු බරක් බිහිවිය හැක්කේ,

(i) සමස්ථ බදු බර පාරිභෝගිකයා දරන විට
(ii) සමස්ථ බදු බර නිෂ්පාදකයා දරන විට
(iii) බදු බර පාරිභෝගික අතිරික්තයට බලපෑමක් ඇති නොකරන විට
(iv) බදු පැනවීම නිසා නිෂ්පාදන අතිරික්තය වෙනස් නොවන විට
(v) බදු පැනවීමෙන් ආර්ථික අතිරික්තයට හානි සිදුවන විට

(...........)

Artsapi.lk

**37.** ආනයනික ජංගම දුරකථනයේ මිල රු. 3,000 ක් වන අතර, එම මිලට ම දේශීය නිෂ්පාදකයා තම ජංගම දුරකථනය අලෙවි කරයි. දේශීය නිෂ්පාදකයා අමුද්‍රව්‍ය (යෙදවුම්) සඳහා රු. 2,000 ක් වැය කර ඇත. මෙම භාණ්ඩය සඳහා 10% තීරු බද්දක් පනවයි නම් දේශීය නිෂ්පාදකයාගේ එකතු කළ අගය සහ සඵල ආරක්ෂණ අනුපාතිකය වන්නේ,

| | එකතු කළ අගය | සඵල ආරක්ෂණ අනුපාතිකය |
|---|---|---|
| (i) | 1,000 | 30% |
| (ii) | 2,000 | 25% |
| (iii) | 2,500 | 12.5% |
| (iv) | 3,300 | 10% |
| (v) | 1,300 | 8% |

(...........)

**38.** ඩොලර් 1 = රු. 100 ක් යැයි සිතන්න. රුපියල ඩොලරයට සාපේක්ෂව ක්ෂයවීම නිසා ඩොලර් 1 = රු. 125 දක්වා ඉහළ ගොස් ඇත. රුපියල ඩොලරයට සාපේක්ෂව ක්ෂය වී ඇත්තේ,

(i) 25% කිනි (ii) 15% කිනි (iii) 20% කිනි (iv) 10% කිනි (v) 30% කිනි

(...........)

**39.** මූර්ත විනිමය අනුපාතිකය ඉහළ යෑම සම්බන්ධව එකඟ විය නොහැකි ප්‍රකාශනය වන්නේ,

(i) දේශීය මුදල් ඒකකයේ විදේශ අගය පහළ ගොස් ඇති බව යි.
(ii) දේශීය මුදල් ඒකකයේ විදේශ අගය ඉහළ ගොස් ඇති බව යි.
(iii) ශ්‍රී ලංකාවේ අපනයන සඳහා විදේශ ඉල්ලුම අධෛර්යමත් වී ඇති බව යි.
(iv) ශ්‍රී ලංකාව ආනයන නැඹුරුව ඉහළ යන බව යි.
(v) ගනුදෙනු කරන රටේ උද්ධමන අනුපාතයට වඩා මෙරට උද්ධමන අනුපාතිකය ඉහළ යන විට යි.

(...........)

**40.** ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ කිසියම් රටක් වඩාත් අනම්‍යශීලි ප්‍රතිපත්ති අනුගමනය කරයි නම් එම රටට අත්විඳිය හැකි ප්‍රබල ම අවාසිය වන්නේ,

(i) එම රටේ සේවා වියුක්ති අනුපාතය ඉහළ යෑම.
(ii) විදේශ වත්කම් දුර්වල වීම.
(iii) ලෝක වෙළෙඳාමට ඇති දායකත්වය පටු වීම.
(iv) ජාත්‍යන්තර ප්‍රාග්ධන සංචලනයේ වාසි අහිමිවීම් තුළින් ජාත්‍යන්තර තරඟකාරීත්වය වර්ධනය නොවීම.
(v) ණයගැති බව, අයවැය හිඟය, ගෙවුම් ශේෂ පීඩනය වැනි අස්ථායීතා වර්ධනය වීම.

(...........)

**41.** බදු සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශනය වන්නේ,

(i) බදු පදනම යනු බද්දට විෂය වන දෑය.
(ii) බදු මගින් ඇති කරන හානිකර බලපෑම් අධි බදුබර නමින් හැඳින්වේ.
(iii) සමානුපාතික බදු අනුපාතිකයක් පවතින විට බදු පදනමේ සෑම අගයක දී ම ආන්තික බදු සාමාන්‍ය බදු අනුපාතිකයට සමාන නොවේ.
(iv) බදු වර්ග නියම කළ පසු ඒවා හදිසියේ වෙනත් නොකළ යුතු බව, නිශ්චිතභාවය ලෙස පිළිගැනේ.
(v) මධ්‍යස්ථ බව යනු බදු ක්‍රමයේ විකෘතිතා ඇති නොවන ලෙස බදු අය කිරීම වේ.

(...........)

Artsapi.lk

**42.** රාජ්‍ය අයවැය ලේඛනය හා සම්බන්ධ නොවන ආර්ථික ප්‍රකාශනය වන්නේ,

(i) අතුරු සම්මත ගිණුම
(ii) පරිපූරක වැය ඇස්තමේන්තුව
(iii) වෙළෙඳපොළ නොවන ප්‍රවාහයන්ගෙන් ලබා ගන්නා ණය
(iv) සමස්ත ශේෂය සෘණ අගයක් ගැනීම
(v) තෙරපුම් ප්‍රතිවිපාකය

(..........)

**43.** "උද්ධමන පරතරය" වඩාත් හොඳින් නිර්වචනය කර ඇත්තේ කිනම් ප්‍රකාශනයෙන් ද?

(i) ආර්ථිකයේ පොදු මිල මට්ටමේ හට ගන්නා අඛණ්ඩ වර්ධනය.
(ii) පූර්ණ සේවා නියුක්තිය පවත්වාගෙන යෑමට අවශ්‍ය සමාහාර ඉල්ලුම් මට්ටමට වඩා පහළින් නිර්ණය වන සමාහාර ඉල්ලුම.
(iii) විභව නිමැවුම් රේඛාව මත ඉහළ සිට පහළට ගමන් කරන සැබෑ නිමැවුම් රේඛාව.
(iv) පූර්ණ සේවා නියුක්ති මට්ටම පවත්වා ගැනීමට අවශ්‍ය සමාහාර ඉල්ලුම් මට්ටම ඉක්මවා ඉහළ යන සමාහාර ඉල්ලුම.
(v) වර්ෂ දෙකකට සාපේක්ෂව රුපියලේ මූර්ත අගයේ ඇතිවන වෙනස.

(..........)

**44.** රටක රාජ්‍ය ණය ප්‍රසාරණය තුළින් අයවැය ලේඛනයේ වර්තන වියදමට ඇතිවන ප්‍රබල බලපෑමක් වන්නේ,

(i) රාජ්‍ය ඉතුරුම් ධන අගයක් ගැනීමයි.
(ii) රාජ්‍ය ණය සඳහා ගෙවන පොලී ධාරිතාව ඉහළ යෑම තුළින් රජයේ වර්තන වියදම් වැඩි වීමයි.
(iii) රාජ්‍ය ණය භාවිතා කර පහසුවෙන් අයවැය හිඟය පියවා ගත හැකි වීමයි.
(iv) වර්තන වියදම් ඉහළ යන විට ප්‍රාග්ධන වියදම් දුර්වල වීමයි.
(v) ණය ප්‍රසාරණය වීම තුළින් අනාගත පරපුරේ ඒක පුද්ගල ණය ධාරිතාව ඉහළ යෑම යි.

(..........)

**45.** දෙන ලද සාධක යෙදවුම් ප්‍රමාණයක් භාවිතා කර ශ්‍රී ලංකාව සහ ඉන්දියාව සහල් සහ සීනි නිෂ්පාදනය කරයි.

| රට | සහල් | සීනි |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 12 | 6 |
| ඉන්දියාව | 8 | 4 |

(i) ශ්‍රී ලංකාව අඩු සම්පත් ප්‍රමාණයක් වැය කර ඉන්දියාවට වඩා සහල් ඒකක ප්‍රමාණයක් නිපදවයි.
(ii) සීනි නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය ඉන්දියාව සතු වේ.
(iii) රටවල් දෙකේ ම ආවස්ථික පිරිවැය සමාන බැවින් වෙළෙඳාමෙන් වාසියක් ලැබිය නොහැක.
(iv) ඉන්දියාවට ශ්‍රී ලංකාවට වඩා අඩු ආවස්ථික පිරිවැයක් යටතේ සහල් නිපදවිය හැකි වේ.
(v) ශ්‍රී ලංකාවට ඉන්දියාවට වඩා අඩු ආවස්ථික පිරිවැයක් යටතේ සහල් නිපදවිය හැකි වේ.

(..........)

Artsapi.lk

**46.** සාපේක්ෂ වාසි න්‍යාය පදනම් කරගනු ලබන රටවල් උපකල්පනවලින් බැහැරවෙන උපකල්පනය වන්නේ,

(i) නිරපේක්ෂ වාසිය පදනම් කරගැනීම යි.
(ii) පූර්ණ සාධක සංචලනය යි.
(iii) ප්‍රවාහන පිරිවැය සැලකිල්ලට නොගැනීම යි.
(iv) ස්ථාවර පරිමාණානුකූල ඵල යි.
(v) නිෂ්පාදනය හෝ පරිභෝජනය ආශ්‍රිතව බාහිරතා නොමැති බවයි.

(...........)

**47.** රටක ඉතුරුම් අනුපාතය ඉහළ යෑම, ආයෝජන අනුපාතය ඉහළ යෑම, පොලී අනුපාතිකය පහළ යෑම, උද්ධමනය පහළ මට්ටමක පැවතීමේ ඉහළ ම ප්‍රතිඵලය වන්නේ,

(i) රටක ප්‍රතිශීර්ෂ ආදායම ඉහළ යෑමක් අපේක්ෂා කළ හැකි ය.
(ii) ජනතාවගේ ජීවන තත්ත්වයේ වර්ධනයක් අපේක්ෂා කළ හැකි වේ.
(iii) රටේ දරිද්‍රතා අනුපාතය අවම වීමක් අපේක්ෂා කළ හැකි වේ.
(iv) රටක දිගුකාලීන ආර්ථික වෘද්ධි ප්‍රවණතාවක් අපේක්ෂා කළ හැකි වේ.
(v) අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි ශුභසාධක අංශ වර්ධනයක් අපේක්ෂා කළ හැකි වේ.

(...........)

**48.** ඉදිරි දශක දෙක තුළ මෙරට ජනගහනය සම්බන්ධයෙන් ප්‍රබල ගැටලුවක් බවට පත් වන්නේ,

(i) රටේ ශ්‍රම බලකාය අඩු වීම තුළින් නිෂ්පාදනය පහත වැටීමයි.
(ii) වයස් යැපෙන්නන්ගේ ප්‍රතිශතය වැඩීම තුළින් රජයේ වර්තන වියදම් ඉහළ යෑම යි.
(iii) බාල වයස් යැපෙන්නන්ගේ ප්‍රතිශතය අඩු වීම නිසා ඉදිරියේ දී ශ්‍රම බලකාය ප්‍රතිශතය අඩු වීමයි.
(iv) කාන්තා ශ්‍රම සහභාගීත්ව අනුපාතය පහළ මට්ටමක පැවතීම නිසා කුටුම්භ ආදායම් ශක්තිමත් නොවීම යි.
(v) ඉදිරි දශකය තුළ මෙරට ජනගහන වර්ධන වේගය බලවත් වීම මත වෘද්ධියේ ප්‍රතිලාභ දුර්වල වීමයි.

(...........)

**49.** BRICS රටවල වර්තමාන මූලික සහ සුවිශේෂිත අරමුණක් වී ඇත්තේ,

(i) තම රටවල් අතර ජාත්‍යන්තර ප්‍රාග්ධනය තවදුරටත් සංචලනය කර ගැනීමයි.
(ii) සාමාජික රටවල විදේශ වත්කම් යොදා BRICS ජාත්‍යන්තර බැංකුවක් පිහිටුවීමයි.
(iii) තාක්ෂණය තව තවත් වර්ධනය තුළින් පිරිවැය අවම කර ජාත්‍යන්තර වෙළෙඳාමේ දායකත්වය වර්ධනය කර ගැනීම යි.
(iv) සංවර්ධනය වෙමින් පවතින රටවල ව්‍යාපෘති අවශ්‍යතා සඳහා සහන ණය සැපයීමයි.
(v) ජාත්‍යන්තර වත්කම් අත්කර ගැනීම තුළින් ලෝක ආර්ථික බලය තමන් වෙතට යොමු කර ගැනීමයි.

(...........)

**50.** මෑතකාලීනව සර්ව සහභාගීත්ව වෘද්ධි ප්‍රතිපත්ති පිළිබඳව ගෝලීය ආර්ථික විශේෂඥයෝ අවධානය යොමු කරමින් සිටිති. සාර්ව සහභාගීත්ව ආර්ථික වෘද්ධිය වඩාත් හොඳින් ගම්‍ය වන්නේ,

(i) දිගු කාලයක් තිස්සේ සිදු කෙරෙන ආර්ථික වෘද්ධිය සහ සංවර්ධනය.
(ii) ආර්ථික වෘද්ධිය සමඟ ආදායම් විෂමතාව අවම කිරීම.
(iii) ආර්ථිකයේ සෑම අංශයකට ම පැතුරුණු ඉහළ තිරසාර සංවර්ධනයක් ලබා ගැනීම.
(iv) ප්‍රතිශීර්ෂ ආදායම ඉහළ මට්ටමක තබාගෙන ජීවන තත්ත්වය වර්ධනය කර ගැනීම.
(v) ආර්ථිකයේ දරිද්‍රතාව අවම කර, දිළින්දන් ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය සහභාගී කරවා ගැනීම. (...........)

Artsapik